Page 11 Aug-Sep 2012.qxd 24/09/2012 18:56 Page 1

මට මේ බොරු අල්ලන්නෙ නෑ!

මිනිසෙක් තම බල්ලා විකුණන්නට කල්පනාකර බල්ලා සමග අල්ලපු ගෙදර ගේට්ටුව ළඟට ගොස් අසල්වැසියාට අඩගසා මෙසේ කීවේය.

" මං මේ බල්ලා විකුණන්නයි යන්නෙ.... මූ කතා කරන බල්ලෙක්.... ඔහේට ඕන නම් පවුම් පහකට මූව ගන්න පුලුවන්...."

" කතාකරන බල්ලෙක්....? කොහේද ඕයි කතාකරන බල්ලො ඉන්නෙ....? අසල්වැසියා කීය. " තමුසෙ මාව නිකං ගොනාට අන්ද-වන්න හදන්න එපා...."

" බොරු නෙවෙයි.... අම්මපා මූ කතා කරනවා...." මිනිහා යළිත් කීය.

එවිට බල්ලා අසල්වැසියා දිහා ඉතා දුක්මුසුව බලමින් මෙසේ කීවේය.

" අනේ මහත්තෙයො පිං සිද්ධ වේවි මාව සල්ලි දීලා ගන්න....මේ මිනිහ මට හරියට වධ හිංසා කරනවා.... අතට අහුවෙච්ච එකෙන් දමලා ගහනවා.... දැනටම පයින් ගහලා මගේ තුනටිය කඩලා තියෙන්නේ.... මං හුහක් වෙලාවට බඩගින්නෙ ඉන්නෙ. හරි කෑමක් දෙන්නෙ නෑ.... කඩෙන් ලාබෙට කෂඩ මොනව හරි පොඩ්ඩක් ගෙනැල්ල දෙනව.... මං නිදාගන්නෙ හීතලේ ගැහි ගැහි එළියෙ ගැරේජ් එකේ.... මම විශේෂ බල්ලෙක් කියලා මේ මිනිහා තේරුම් අරන් නෑ.... ගිය අවුරුද්දේ මම අත්ලන්තික් සාගරේ එහා පැත්තට පීනුවා.... ඊට ඉස්සෙල්ලා අවුරුද්දෙ උත්තර ධ්‍රැවයෙ අයිස් ස්කේටිං ගියා.... මට සහතික සම්මාන ගණනාවක් තියෙනවා.... ඒ වුනාට මං දැන් හරි දුකක් විඳින්නේ...."

ඒ කතාවෙන් පුදුමයට පත් අසල්වැසියා මිනිසා ඇමතී ය.

" හැබෑව තමයි මූට කතාකරන්න පුලුවන් නේ.... ඒත් ඉතින් මොකද ඔහේ මෙච්චර වටින බල්ලෙක් තුට්ටු දෙකට දෙන්නෙ....? "

" මට එපා වෙලා තියෙන්නේ මූ හරියට බොරු කියනවා...". මිනිසා කීය. " දැන් ඔය මූ ඔහේට කිව්වෙ මාර බොරු තොගයක්....! "

කණගාටුයි වෙන්න යන දේට

බාර් එකක බොන අතරේ දෙදෙනෙකුගේ දෙබසක්

1 වැන්නා : මවං මගේ වයිප් කිව්වා මාව දාලා යනවයි කියලා මම බීම නැවැත්තුවෙ නැත්තං....

2 වැන්නා : හැබෑට....? මවං ඒ ගැන අහන්නත් කණගාටුයි....

1 වැන්නා : මවං දාහකින් හොයාගන්න බැරි ගෑණියෙක්..... මොනවා කරන්නද මවං .....මමත් මේ හරි කණගාටු-වෙන් හිත හදාගෙන ඉන්නේ.....

ලිහිණියා LIHINIYA

ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල

ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ

එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප පිට්ටු, රොටි කොත්තු, බුරියානි

උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.

කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන

ලිහිණියා විශේෂ නිශ්පාදනයක් වන

බැදපු සහ අමු තුනපහ දැන් ඉතා ජනප්‍රියයි

Tel. 0208 4509052

66 Cricklewood Broadway, London NW2 3EP

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි

සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ

♦ **ට්‍රයිකෝ - කොළඹ**

50 සිරිල් සී පෙරේරා මාවත

කොළඹ 13

දුරකතනය 448270 / 432236

♦ **ට්‍රයිකෝ - ගාල්ල** ♦ **ට්‍රයිකෝ - කුරුණෑගල**

සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.

දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.

TRICO

Shipping & Forwarding Ltd

555 White Hart Lane

London N17 7RP

Telephone 0208 888 8787

Fax 0208 889 5445

E-Mail : trico@tricoshipping.com

නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය



නැතිවුණු තොප්පිය

ශ්‍රෙශ්‍රෙය්‍ය කර්මයකින් පසු මහළු ලෙඩා සිහිය ඇවිත් ඇස් ඇරියේය.

" දෙයියන්ට පින් සිද්ධ වෙච්චාවෙ.... යාන්තම් වැඩේ ඉවරයි...."

ඔහු සැනසුම් සුසුමක් හෙලුවේය. එවිට දකුණු පැත්තේ ඇඳේ සිටි ලෙඩා මෙසේ කීවේය.

" ඒ අතින් උන්නැහේ ඔහේ වාසනාවන්තයි..... මගේ ඔපරේෂන් එකේදී මේ යක්කු මතක නැතුව කතුරක් ඇතුළෙ තියෙදදි මහලා..... ඒක ගන්න ආයිත් මගේ බඩ පලන්න වුණා....."

වම් පැත්තේ ඇඳේ ලෙඩා ද මෙසේ කීවේය.

" මටත් මාර වැඩක් වුණානේ..... දොස්තරගෙ අත්මේස් දෙකම මගේ බඩ ඇතුළෙ.... පස්සෙයි දන්නෙ..... ඉතින් ආයිත් බඩ පලන්න වුණා ඒක ගන්න.... පුදුම දොස්තරලා...".

එවිටම මහලු මිනිසාට ඔපරේෂන් එක කළ දොස්තර වාට්ටුවට පැමිණ හෙදියගෙන් මෙසේ ඇසුවේය.

"නර්ස්.... මගේ තොප්පිය එහෙම දැක්කද...? "

ඒ ඇසූ මහලු ලෙඩාට සිහි නැතිවිය.

මුදලාලිගෙ ගණිතය

තරුණයන් හය දෙනෙක් වේගයෙන් දුවගෙන විත් නගරයේ වූ වෙළඳසල වෙත ගියේ හති අරිමිනි. දුව ආ එක් තරුණයෙක් කඩ හිමියාට මෙසේ කීවේය.

තරුණයා : මුදලාලි අපට හරිම මහන්සියි..... හරිම තිබහයි.... ඉක්මනට අපට බොන්න මොකවත් දෙන්න.... අපි මේ හැතැප්ම 24 ක් විතර දුරක් දුවගෙනයි එන්නෙ....

මුදලාලි : අයියෝ ඕකත් මහ ලොකු වැඩක්ද? හැතැප්ම 24 ක් හයෙන් බෙදුවම එක් කෙනෙකුට වැටෙන්නෙ හැතැප්ම හතරයි නේ.....

බිල

දිනක් අයිරිෂ් ජාතිකයෙක් කැනඩාවේ වැන්කුවර් නගරයේ අවන්හලකට පැමිණියේ ය. ඔහු වේටර් අමතා බියර් බෝතලයක් ඕඩර් කළේ ය. වේටර් බියර් බෝතලයක් ගෙනැවිත් තැබීය. එය පානය නොකළ ඔහු එහි ගණන ඇසී ය. එය ඩොලර් 3 ක් වන බව වේටර් පැවසූ විට එය ආපසු ගෙනගොස් බියර් බෝතලයේ වටිනාකමට සමාන පෘට් සැලඩ් එකක් ගෙනෙන ලෙස කීවේ ය. වේටර් පෘට් සැලඩ් එකක් ගෙනැවිත් ඔහු ඉදිරියේ තැබුවේය.

පෘට්සැලඩ් එක ඉක්මනින් කා දැමූ අයිරිෂ් ජාතිකයා නැගිට යන්නට සැරසෙන විට වේටර් දුවගෙන විත් ඔහුට බිල මතක් කළේ ය.

" මොන බිලද? මොකටද මම බිලක් ගෙවන්නෙ ? " අයිරිෂ්කාරයා ඇසී ය.

" ඇයි සර් එහෙම කියන්නෙ.... සර් දැන් පෘට් සැලඩ් එකක් කෑවෙ "

" අයිෂෙ ඒක මම ගත්තෙ බියර් බෝතලේ දීලා ඒකෙ වටිනාකමට.... "

" එහෙනම් සර් බියර් බෝතලයට බිල ගෙවන්න.... " වේටර් කීවේ ය.

" ඒ මොකටද....? ඒක මං බිව්වෙ නෑනේ...."

එසේ කියා අයිරිෂ්කාරයා නැගිට යන්නට ගියේය. කිසිවක් තේරුම්ගත නොහැකිව වේටර් තවමත් ඔහු ගිය දෙස බලා සිටී.

ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත.

ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 13 ක චෙක්පතක් Lanka Viththi යනුවෙන් ලියා පහත සඳහන් ලිපිනයට එවන්න.

Lanka Viththi

P. O. Box 64678,

London NW3 9LS

කුණු බිත්තර ගහමුද?

මිනිහෙක් නාට්‍ය ශාලාව ළඟම තිබෙන සිල්ලර කඩයට ගොස් මෙසේ කීවේ ය.

" මුදලාලි මේ කඩේ තියන සේරම කුණු බිත්තර ටික මට දෙන්න... කීයක් ගත්තත් කමක් නෑ....."

" ඒ මොකටද සේරම කුණු බිත්තර ඉල්ලන්නෙ....? මේ හෝල් එකේ මේ දැන් පෙන්නන අර මුස්පේන්තු විහිළුකාරයට ගහන්න වත්ද....?."

එවිට මිනිහා බැගෑපත්ව මෙසේ කීවේ ය.

" ආ.... එහෙනම් මුදලාලි ඒ නාට්‍යය බලලා තියෙනවා.... මම තමයි මුදලාලි ඒ විහිළුකාරයා.....

සුබ ආරංචි / අසුබ ආරංචි

ලේ පරීක්ෂණ වාර්තාව සෝදිසියෙන් කියවා බැලූ නීතිඥවරයා මිනීමැරුම් චෝදනාව ලබා සිටින තරුණයාට කතාකළේ ය.

නීතිඥ : ඉස්සෙල්ලාම දැනගන්න ඕන සුබ ආරංචියද? අසුබ ආරංචියද?

තරුණයා: ඉස්සෙල්ලා අසුබ ආරංචිය කියන්න.....

නීතිඥ: තමුසෙගෙ ලේ වල තියන DNA සහ මිනීමැරුම වුණු තැන තිබුණු දේවල DNA සළකුණු සේරම සමානයි

තරුණයා: හැබෑට.....? එතකොට සුබ ආරංචිය.....?

නීතිඥ : තමුසෙගෙ කොලොස්ටරල් ලෙවල් එක සැහෙන්න බැහැලා

An Internet Umbrella අන්තර්ජාල කුඩයක්

The Brolly Vision

Watch slide - shows on the umbrella which will stop you getting lost.

Rainy days will never seem as dull again thanks to a new internet umbrella.

The high-tech brolly allows you to take pictures with a built-in camera. Then those can be uploaded to Flickr (a photo-sharing website) via a wireless internet connection and within two minutes you can watch downloaded photo-streams on your umbrella screen with a simple wrist-snapping movement.

Invented in Tokyo (where else ?) the Pileus umbrella also has GPS and a digital compass, which uses Google Earth to help you navigate yourself around the world. They are working on incorparating a video camera as well.

The project started out as academic research at Keio University in Spring 2006, but now Pileus LLC is keen to make it a money-spinning venture. No word yet on how much the umbrella would cost, but it is likely to be very expensive. Just don't leave it on the tube.

මේ අළුතින් ම ජපානයේ නිශ්පාදනය කරන ලද පරිගණක කුඩයයි. මෙය වෙනත් කුඩ වගේ කෙනෙකු වැස්සෙන් ආරක්ෂාකරන අතරම, කුඩය ඇතුළේ සවිකරන ලද පරිගණක මෙවලම් නිසා විඩියෝ හා චිත්‍රපට ද, ටෙලිවිෂන් ප්‍රවෘත්ති ද ඇසිය හැක. බැලිය හැක. ඊට අමතරව මෙහි ඇති අධි තාක්ෂණික උපකරණ ඇසුරෙන් පින්තූර ගත හැකි ය. එම පින්තූර රැහැන් රහිත පරිගණක සම්බන්ධීකරණයක් මගින් තවත් ජායාරූප වෙබ් අඩවියකට යැවූ පසු එම වෙබ් අඩවිය එම පින්තූර **ගූගල් අර්ත්** නම් තොරතුරු සොයන ක්‍රමය තුළින් හරියටම ඒ ස්ථානය පිහිටා ඇත්තේ කොහිදැයි අනාවරණය කරයි. එමගින් ලොව කොයි තැනක සිටියත් කෙනෙකුට අතරමං නොවී තමනට අවශ්‍ය තැනට ළඟා වන්නට හැකි වේ. වැඩි බරක් නැත. ගෙනයාමට ද ඉතා පහසු ය.

තාක්ෂණික පර්යේෂණයක් ලෙස ජපානයේ කියෝ විශ්වවිද්‍යාලය මගින් පසුගිය 2006 වසරේ නිපදවූ මෙම පරිගණක කුඩය දැන් විකුණුම් භාණ්ඩයක් ලෙස වෙළඳ පොළට යවන්නට නිෂ්පාදකවරුන් තීරණයකර තිබේ. මෙයට විශාල මිළක් නියම වනවා නිසැකය. හැබැයි මේ කුඩය මතක නැතුව බස යෙන් හෝ දුම්රියෙන් බැස්සොත් විශාල පාඩුවක් වෙනවා ඇත.

SHANTHI & CO

Solicitors & Commissioners for Oaths

We are an established law firm in North London

Specialising in Immigration matters (Visas, **Tier 1** General - Highly Skilled Migrants / **Tier 2** Skilled Workers (WorkPermits), Students, Domestic Workers, Appeals - Judicial Reviews etc.)

♦ Residential / Commercial Conveyancing

♦ Landlord and Tenant Disputes ♦ Divorce♦ Employment Law

♦ General Litigation (Sale of Goods, Services, Debts etc.)

♦ We offer comprehensive services on legal maters in Sri Lanka

***Contact*:- Shanthi Senadheera (*Solicitor*) Padmini Senadheera (*Solicitor*) Dinu Senadheera (*Solicitor*)**

206 Seven Sisters Road, Finsbury Park, London N43NX

Tel. 020 7561 9494 Fax 020 7561 9495

Emergency: 07956 129 642 shanthi.co@btconnect.com